# වයාපාර කළමණාකරණ කමිටු වාර්තාව 2019 ජනවාරි මාසය

## මිණිපේ මහා වාරිමාර්ග ව්‍යාපාරය.

- දිනය :- 2019/ 01/ 24
- ස්ථානය :- මිණිපේ ව්‍යාපාර කාර්යාලය
- වේලාව :- පෙ.ව. 10.00
- සහභාගිත්වය :- පැමිණීමේ ලේඛණය අමුණා ඇත.

| ඉදිරිපත් කරණ නිළධාරියා ආයතනය | කාරණය |
|---|---|

සිරිත් පරිදි ආගම සිහිකිරිමෙන් අනතුරුව පිළිගැනිම හා අරමුණ පැහැදිලි කිරිම මිණිපේ නේවාසික ව්‍යාපාර කළමණාකාරතුමා විසින් සිදු කරමින් 2019 වර්ෂය සඳහා සියලු දෙනාට සුභපැතුම් ප්‍රාර්ථනා ලදි.

අරමුණු

1. 2019 වර්ෂය සඳහා ඉදිරි සැලැස්ම සහ ඉලක්කයන් පිළිබඳ සාකච්ඡා කිරීම.
2. 2019 වර්ෂය තුළ පීසෙප් වයාපෘතියේ ක්‍රියාත්මක කිරීමට නියමිත කෙත් ඇල පිළිබඳ හා එහි සංවර්ධන කටයුතු පිළිබඳ සාකච්ඡා කිරීම
3. ක්‍රිප් ව්‍යාපෘතිය පිළිබද මේ වන විට පවතින තත්වය පිළිබද සාකච්ඡා කිරීම

ලිපි ඉදිරිපත් කිරීම

I. සේනා දළඹුවා මර්ධනය පිළිබද දිස්ත්‍රික් මට්ටමේ කමිටු පත් කිරීම සම්බන්ධව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ විසින් නේ.ව්‍යා.කළමනාකරුට යොමු කරන ලද ලිපිය
II. සේනා දළඹුවා පාලනවිශේෂ ක්‍රියාන්විතය සම්බන්ධයෙන් වාරිමාර්ග කළමනාකරණ අංශය මගින් යොමුකරන ලද ලිපිය
III. හසලක ප්‍රා.වාරිමාර්ග ඉංජිනේරු විසින් නේ.ව්‍යා.කළමනාකරුට යොමුකරන ලද පීසෙප් ව්‍යාපෘතිය මගින් සංවර්ධනය කිරීමට නියමිත ඩී 35,හා ඩී38 ඇල මිණුම් කටයුතු සිදු කිරීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවක් කිරීමට දිනයක් වෙන්කර ගැනීම සම්බන්ධ ලිපිය
IV. මෙතෙක් කිසිදු කෘෂිකාර්මික ඉඩම් ලේඛනයක ඇතුලත්ව නොමැති ගොඩ ඉඩමක් අයිතිකරුගේ ඉල්ලීම මත කෘෂිකාර්මික (ගොඩ) ඉඩම් ලේඛනයට ඇතුලත් කිරීම හා යම් ඉඩමක් කෘෂිකාර්මික ඉඩමක් නොවන බව වාරිමාර්ග කළමනාකරණ අංශය මගින් යොමුකරන ලද ලිපිය
V. ඒකාබද්ධ ගො.සං. සභාපති විසින් ඉඩම් කොමසාරිස් - මහියංගනය යොමු කරන ලද 2 පියවර ඉඩම් සම්බන්ධ ලිපිය
VI. 3 පියවර ඩී 35 බෙදුම් ඇල ගො.සං. සභාපති විසින් ඩා෧ 39 බෙ.ඇල නාවත් බට සහ කෘෂි පාර සම්බන්ධයෙන් නේ.ව්‍යා.කළමනාකාරතුමාට යොමු කරන ලද ලිපිය
VII. “ජනපතිට කියන්න” ජාතික වැඩසටහනට යොමුකරන ලද පැමිණිල්ල සම්බන්ධව 2 පියවර ඩී 21 ඇලේ රක්ෂිත වෙන් කිරීම සම්බන්දව ප්‍රා.වාරි මාර්ග ඉංජිනේරු විසින් නේ.ව්‍යා.කළමනාකරුට යොමු කරන ලද ලිපිය

| | |
|---|---|
| නේ.ව්‍යා.කලමනාකරු | 2019 වර්ෂය ආරම්භයේ පවත්වන්නට යෙදෙන ප්‍රථම ව්‍යාපාර කලමනාකරණ කමිටු රැස්වීම බවත් එබැවින් මෙම වර්ෂයට අදාලව ඉදිරි සැලැස්මකින් යුතුව කටයුත කලයුතු බවත්<br><br>2018 වර්ෂ අවසානයේ සිදු කල ගොවි ක්ෂේත්‍ර චාරිකාව පිළිබඳ නැවත මතකයට නගමින් කියා සිටියේ මිණිපේ ගොවීන්ට අවශ්‍යතාවය ඇත්නම් TOM-EJC අඹ ,කෙසෙල් වැනි භෝග වගා කිරීමට අවශ්‍ය දැනුම ලබා දීමට හා ඊට අවශ්‍ය බීජ පැල ලබා දීමට සුදුසු ව්‍යාපෘති, පුහුණු කිරීම් ආදිය ලබා දීමේ හැකියාව පවතින බවත්<br><br>මෙම වර්ෂය තුළ විවිධ පුහුණු වැඩ සටහන් වැඩිවශයෙන් පැවැත්වීමට සූදානම් බවත්<br><br>2018 වර්ෂය සඳහා වන විගණන වාර්ථා සකස් කිරීම 2019 මාර්තු මාසයට පෙර අවසන් කලයුතු බවත් එසේ නොවන ගො.සං සඳහා මාර්තු මාසයෙන් පසු කිසිදු හේතුවක් මත මුදල් නිදහස් කිරීමක් සිදු නොකරන බවත්<br><br>- 2019 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්ම තුළ<br>- ජාතික වශයෙන් හොදම බාස් තෝරා ගැනීම<br>- හොදම බිත්තර වී නිෂ්පාදනය කරන ගොවීන් තෝරා ගැනීම<br>- හොදම ගොවි සංවිධානය තේරීම ආදී තරගකාරී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නියමිත බවත්<br><br>2019 වර්ෂය සඳහා පීසෙප් ව්‍යාපෘතිය යටතේ 1,3 පියවර තුළ කෙත් ඇළවල් කිහිපයක් සංවර්ධනය කිරීම සිදුවන අතර ඒ සඳහා මූලික දත්ත සමීක්ෂන කටයුතු හා ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්ම සිදු කිරීමට නියමිත බවත් ,1,2,3,4 පියවරයන් සඳහා මූලික දත්ත සමීක්ෂණ කටයුතු පහත සඳහන් පරිදි.<br>1 පියවර - 2/14 දින<br>2 පියවර-2/08 දින<br>3 පියවර -2/07 දින<br>4 පියවර -2/11 දින<br>සිදු කිරීමට නියමිත බවත්<br><br>JAP වාර්ථාව සකස් කිරීම ඒ ඒ ගොවිසංවිධාන වලට අදාලව සිදු කිරීමට නියමිත බවත් ප්‍රකාශ කරන ලදී. |
| 2 පියවර<br>ආය.සං.නිලධාරි | ප්‍රා.ගො.සං රැස්වීම පැවැත්වූ බවත් 2019 වර්ෂයේ පැවැත්වීමට නියමිත නිලවරණ මහ සභා රැස්වීම් පිළිබඳ ලේඛනය ඉදිරිපත් කරමින් 2019 මැයි,ජුනි මාසයන් තුළ එම නිලවරණ පැවැත්විය යුතු බවත් සියලුම ගොවි සංවිධාන 2018 වර්ෂය සඳහා වන විගනණ වාර්ථා සියල්ල මේ වන විට සකස් කර අවසන් බවත් පසුගිය මාස් කන්නය සඳහා පොහොර පරිහරණ මුදල් පිළිබඳ අයවැය ලේඛනයක් සකස් කර සෑම ගො.සං විසින්ම ලබා දීමට කටයුතු කරන ලෙසත් තමන්ගේ ස්ථානමාරුව අවලංගු කිරීම සඳහා ඒකාබද්ධ ගො.සං සභාපතිතුමා හා ඒ සම්බන්ධ කටයුතු කල 2 පියවර සියලුම ගො.සං සභාපතිවරුන්ට ස්තූතිය ප්‍රකාශ කරන ලදී. |

| | |
|---|---|
| 03 පියවර සංවර්ධන සහකාර නිලධාරි | 03 පියවර ප්‍රා.ගො.සං රැස්වීම පැවැත්වූ බවත් 2019 වර්ෂයට අදාල සියලුම නිලවරණ මැයි,ජූනි මාසයන් තුළ පවත්වා අවසන් කලයුතු බවත් 2019 මාර්තු මාසයට පෙර විගණන වාර්ථා සකස් කර අවසන් කලයුතු බවත් ගො.සං දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම ඉදිරියට සිදු කලයුතු බවත් පුහුනු වැඩ සටහන්වල වැදගත්කම පිළිබදවත් අදහස් දක්වන ලදී. |
| 04 පියවර සං.නිලධාරි | 4 පියවර 2019 වර්ෂය වැඩ සැලැස්ම පිළිබදව ඉදිරියේදී ප්‍රා.ගො.සං.රැස්වීම කැදවා තීන්දු තීරණ ගනු ලබන බවත් සෑම ගො.සං විසින්ම සිදු කරනු ලබන සංවර්ධන කටයුතු පිළිබද විස්තර පත්‍රිකාවක් ලබා දෙන ලෙසත් මාර්තු මාසයට පෙර සියලුම ගොවි සංවිධාන විගණනය කර වාර්ථා ලබා දීමට කටයුතු කරන ලෙසත් 2019 වර්ෂයට අදාල නිලවරණ පැවැත්වීමට කටයුතු කරන ලෙසත් දැනුම් දෙන ලදී. |
| 1 පියවර සංවර්ධන නිලධාරි | 2019 වර්ෂයට අදාල නිලවරණ අදාල කාලසීමාව තුළ පැවැත්විය යුතු බවත් 2019 වර්ෂයේ ක්‍රියාත්මක වන පීසෙප් ව්‍යාපෘතියට අදාල 1 පියවර ඩී 35 හා ඩී 24 ඇළ ගො.සං නාම ලේඛන මේ වන විට ලබාගෙන ඇති බවත් ක්ෂේත්‍ර තොරතුරු ලබා ගැනීම ඉදිරි දිනයකදී සිදු කිරීමට නියමිත බවත් අනෙකුත් ගො.සං තොරතුරු ලේඛන ඉතා කඩිනමින් ලබා දීමට කටයුතු කරන ලෙසත් දැනුම් දෙන ලදී. |
| විගණක නිලධාරි රත්නායක මහතා | ගණුදෙනු පවත්වාගෙන යනු ලබන සෑම ආයතනයක් විසින්ම තම ආයතනයේ ගණුදෙනු විනිවිධ භාවයකින් යුතුව පවත්වාගෙන යාම සදහා සෑම වර්ෂයක් අවසානයේදීම බාහිර විගණකවරයෙකු ලවා විගණනය කරවා ගැනීමේ වැදගත්කම හා අවශ්‍යතාවය පිළිබද පැහැදිලි කිරීමක් සිදු කරන ලදී. |
| 2 පියවර ප්‍රා.ගො.සං.සභාපති | 2019 වර්ෂය ආරම්භයත් සමග කෘෂිකර්මාන්තයට බලපා ඇති සේනා දළඹුවාගේ තර්ජනය මේ වන විට ලංකාව පුරා පැතිර යන අතර ඊට විසදුම් සෙවීමට කිසිවෙකුත් අපොහොසත් වී ඇති නමුත් එය ඊට වගකිවයුතුතන්ගේ විශේෂ වගකීමක් බවත්<br><br>මිණිපේ ව්‍යාපාරය තුළද මේ වන විට යම් යම් ස්ථානවල සේනා දළඹුවා පැතිර ඇති බැවින් ඒ පිළිබද මාධ්‍ය ද දැනුවත් කල බවත්<br><br>2 පියවර ප්‍රා.ගො.සං රැස්වීම පැවැත්වූ බවත් 2 පියවර නාවත් බට පිළිබද ගැටළුව සදහා කිසිදු ආකාරයක විසදුමක් ලැබී නොමැති බවත් සමස්ථ මිණිපේ ව්‍යාපාරය තුළම සිදු වූ සංවර්ධන කටයුතු පිළිබදව මේ වන විට විවිධ ගැටළු පැනනැගී ඇති බවත් 2018 වර්ෂයේදී පීසෙප් ව්‍යාපෘතිය කරන ලද ඇලවල් සදහා මේ වන තෙක් මුදල් නොලැබී ඇති බවත් ඒ හේතුවෙන් ගො.සං අපහසුතාවයට පත්ව ඇති බවත් එම මුදල් කඩිනමින් ලබා දීමට කටයුත කරන ලෙසත්<br><br>රක්ෂිත වෙන් කිරීම පිළිබද ගැටළු පවතින බවත්<br><br>ක්‍රිප් ව්‍යාපෘතිය මගින් සංවර්ධනය කරනු ලැබූ ඇළවල්වල එම සංවර්ධන කටයුතු මේ වන විටත් අවසන් අදියරයට පත්වී නොමැති අතර එම සංවර්ධන වැඩ කටයුතු නිම කරනු ලබන්නේ කවදා කෙසේද යන්න පිළිබද දිස්.කෘෂි.කමිටුවේදී ප්‍රශ්න කල බවත්<br><br>ඉදිරි කාලය තුළදී මිණිපේ ව්‍යාපාරයට පාංශු පරීක්ෂණාගාරයක් ලැබීමට නියමිත බවත් එය මිණිපේ ව්‍යාපාරයට විශාල සම්පතක් වන බවටත් අදහස් දක්වන ලදී. |
| 1 පියවර ප්‍රා.ගො.සං.සභාපති | මේ වන විට රක්ෂිත සම්බන්ධ විශාල ලෙස ගැටළු පැනනැගී ඇති බවත් ඊට දේශපාලනික මැදිහත් වීම් හේතුකොට ගෙන කිසිදු රාජ්‍ය නිලධාරියකු ඊට මැදිහත් නොවීමත් ,අනවසර ඉදිකිරීම් පිළිබදව කිසිදු ආකාරයක නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කිසිදු රාජ්‍ය |

| | |
|---|---|
| | නිලධාරියකුගේ සහයෝගය නොලැබෙන බවත් එවිට ගොවි සංවිධාන වශයෙන් තමන් ඇතුළු අනෙකුත් ගො.සං නිලධාරීන් අපහසුතාවයට හා අසරණභාවයට පත්වන බවත් මෙම තත්වය දිගින් දිගටම පැවතුණ හොත් මහජනතාව ලෙස ඉදිරියේදී යම් යම් ක්‍රියාමාර්ග ගැනීමට සූදානම් බවත්<br>මහ කන්නය තුලද ජල මුර ක්‍රමයක් ක්‍රියාත්මක වන බැවින් 1 පියවර ඩී 32 වැනි ගො.සං කිහිපයක අගාවත ගොවීන් ජල හිගතාවයෙන් පීඩිතව සිටින බවත් එබැවින් අඩුම වශයෙන් තව දිනයක් හෝ ජල මුරය දීර්ඝකර දෙන ලෙස ඉල්ලීම් කරන බවත්<br><br>තවද 1 පියවර ගො.සං තුළ ක්‍රියාත්මක කරන ක්‍රිප් ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු පිළිබඳ විවිධාකාරි ගැටළු මතුවී ඇති බවත් එම ගැටළු නිරාකරණය කර දීම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වගකීම බවත් ප්‍රකාශ කරන ලදී. |
| 3 පියවර ප්‍රා.ගො.සං.සභාපති | 3 පියවර ප්‍රා.ගො.සං රැස්වීම පැවැත්වූ බවත් එහිදී ගො.සං.විසින් 2019 වර්ෂයේ සිට සිදු කරනු ලබන සියලුම සංවර්ධන කටයුතු පිළිබඳ විස්තර ලේඛනයක් සකස් කිරීමටත් 2019 වර්ෂ ගො.සං ඉලක්ක පිළිබඳව සාකච්ඡා කල බවත් ක්‍රිප් ව්‍යාපෘතිය තුළින් 3 පියවර සංවර්ධන කටයුතු සිදු කලද එහි සාර්ථකභාවයට වඩා අසාර්ථක බව පෙන්නුම් කරන බවත්<br>විල්ගමුව ප්‍රදේශය තුළ සේනා දළඹුවා පැතිර ඇති බවත් කීඩෑ හානියද මේ වන විට පැතිර ගොස් ඇති බවත් එබැවින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිවැරදි උපදෙස් ලබා දීමට කටයුතු කරන ලෙසත්<br>වල් අලි ,වදුරන්,ඌරන්,මොණරුන් වැනි සතුන්ගෙන් 03 පියවර වගාහානි සිදුව ඇති බවත් එය සෑම කන්නක් පාසාම සිදු වන බවට අදහස් දක්වන ලදී. |
| 4 පියවර ප්‍රා.ගො.සං සභාපති වෙනුවට ඩී 02 ගො.සං සභාපති | 4 පියවර සියලුම ගො.සං වල වගා කටයුතු ජනවාරි මස අවසන් වන විට පීදුම් තත්වයෙ පවතින බවත් එබැවින් අස්වනු නෙලීමෙන් පසු ඉතා කඩිනමින් ඉදිරි යල කන්නය සඳහා ජලය නිකුත් කිරීම සුදුසු බවත් එවිට යල මහ කන්න දෙක අතර කාලය සංවර්ධන කටයුතු සඳහා දින ලබා දීමට හැකියාව ඇති බවත්<br><br>ක්‍රිප් ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතුවල ගැටළුකාරී තත්වයන් බොහොමයක් ඇති බවත් එම ගැටළු විසඳා දීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු බවත්<br>වගා හානි සිදු වූ ගොවි මහතුන් වෙනුවෙන් කෘෂි රක්ෂණ වන්දි ලබා දීමට කටයුතු කල සියලුම නිළධාරීන් වෙනුවෙන් ස්තූතිය පුද කරන බවත් ප්‍රකාශ කරනලදී. |
| වාරිමාර්ග ඉංජිනේරු | ක්‍රිප් ව්‍යාපෘතිය මගින් යොදනු ලැබූ නාවත් බට පිළිබඳ ගැටළු ඇත්නම් ඒ පිළිබඳ ලේඛන තමන් වෙත ලබා දෙන ලෙසත්<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව ලෙස තමන් ඇතුළු සියලුම නිලධාරීන් කැපවීමෙන් යුතුව සියලුම සංවර්ධන කටයුතු සාර්ථකව ඉටු කිරීමට උත්සහ දැරුවද කොන්ත්‍රාත් සමාගම විසින් සිදු කරනු ලබන අකටයුතුකම් හේතුවෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව චොදනා ලබන බවත්<br>කිසිදු හේතුවක් මත කොන්ත්‍රාත් සමාගම් වලට මෙම සංවර්ධන වැඩ වලින් පැනයාමට ඉඩක් නොතබන බවත් මාස 04ක පමණ කාලයක් සංවර්ධන කටයුතු සඳහා ලබා දී ඇති බවත්<br>43 ගො.සංවිධානයේ දිගින් දිගටම පවතින ගැටළු පරීක්ෂා කිරීම සඳහා හෙට දිනයේදී (1/26) ක්ෂේත්‍රයට පැමිණ විසදුම් ලබා දෙන බවත්<br>ඕනෑම සංවර්ධන ව්‍යාපෘතියක් සිදු කිරීමේදී යම් යම් ආකාරයට ගැටළුකාරී තත්වයන් පැන නගින බවත් 100%ක්ම නිවැරදි මට්ටමේ සංවර්ධන කටයුතු සිදු නොවන් බවත් |

| | |
|---|---|
| | පීසෙප් -කෙත් ඇල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මෙම වර්ෂයේද 1 / 3 පියවරයන්හි ක්‍රියාත්මක කිරීමට සූදානම් බවත් ඒ සඳහා රු .මිලියන 19.5 ක් ලැබී ඇති බවත් උගත් පාඩම් තුළින් ගැටළු අවම කර එම සංවර්ධන කටයුතු සිදු කිරීමට උත්සහ ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී. |
| අමුණ ඉස්සීමේ ව්‍යාපෘතිය - ප්‍රධාන ඉංජිනේරු | මිණිපේ අමුණ ඉස්සීමේ ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු මේ වන විට 60% ක පමණ ප්‍රගතියක් කර ගොස් ඇති බවත් බලාපොරොත්තු නොවූ පරිදි කොන්ත්‍රාත් සමාගම් වලින් සිදු කරන ලද සංවර්ධන කටයුතු වල ගැටළුකාරි තත්වයන් පැන නැගුණ බවත්<br><br>කෙසේ නමුත් මේ වන විට පැනනැගී ඇති ගැටළුකාරී තත්වයන් අප්‍රේල් වන විට විසදා දීමට හැකියාව පවතින බවත් මීට අමතරව ඩී ඇළ සංවර්ධන කටයුතු සඳහා නැවතත් මුදල් ප්‍රමාණයක් ලැබී ඇති බවත් දන්වා සිටින ලදී. |
| ගොවිජන සංවර්ධන ප්‍රා.නිලධාරි | මේ වන විට වගා හානි සඳහා රක්ෂණ වන්දි මුදල් සාමාජික ගිනුම් වලට යොදවා ඇති බවත් 4 පියවර ප්‍රා.ගොවිජන සංවර්ධන නිලධාරි ලෙස කටයුතු කරමින් සිට 2 පියවර ප්‍රා.ගොවිජන සංවර්ධන නිලධාරි ලෙස රාජකාරි කටයුතු සිදු කිරීමට පැමිණි බවත් ගොවින්ගේ ගැටළු පිළිබද සොයා බලා කටයුතු කිරීමට සූදානම් බවත්<br><br>කුඹුරු ඉඩම්වල අනවසර ඉදිකිරීම් ,ඉඩම් ගොඩ කිරීම් ආදිය සිදු කරන්නේනම් ඊට අවසර නැති බවත් යම් හෙයකින් එවැනි දෙයක් සිදු කරන්නේනම් තමන්ගේ අවසරය අනිවාර්යෙන් ලැබිය යුතු බවත් එසේ නොමැතිව ක්‍රියා කරන ඕනෑම පුද්ගලයකු වෙනුවෙන් ගොවිජන සංවර්ධන පනතට අනුව නීතිමය ක්‍රියාමාර්ග ගනු ලබන බවත් ප්‍රකාශ කරන ලදී. |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | මේ වන විට ලංකාව පුරා පැතිර යන සේනා දළඹු වසන්ගතය පිළිබද දීර්ඝ විස්තරයක් කරමින් කියා සිටියේ විශේෂයෙන්ම දේශීය හයිබ්‍රිඩ් ඉරිගු වලට සේනා දළඹුවා පැතිර යාමේ ප්‍රවණතාවය වැඩි බවයි.<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සේනා දළඹුවා පිළිබද මිණිපේ ජනතාව පෙර සිටම දැනුවත් කල බවත් මේ දිනවල සේනා දළඹුවා පිළිබදව දැනුවත් කිරීමේ ජංගම ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක කරන බවත්<br>සේනා දළඹුවාගේ ව්‍යාප්තිය ඉදිරියේදී වී වගාවටද බලපෑම් කල හැකි බැවින් ඒ පිළිබද අවධානයෙන් සිටින ලෙසත් සේනා දළඹුවා මර්ධනය කල හැකි ආකාරය පිළිබදවත් විස්තරාත්මකව පැහැදිලි කරන ලදී. |
| 2 පියවර මූලස්ථාන කෘෂි උපදේශක | සේනා දළඹුවා පිළිබද මිණිපේ ජනතාව මුල් කාලීනව දැනුවත් කල බවත් මේ වන විටත් එම දැනුවත් කිරීම් සිදු කරමින් යන බවත් ඒ අනුව මිණිපේ ගොවි ජනතාවගේ ක්‍රියාකාරිත්වය ප්‍රශංසනීය බවත්<br>සේනා දළඹුවාගේ ව්‍යාප්තිය මර්ධනය කරන ආකාරය පිළිබදවත් පැහැදිලි කරන ලදී. |
| ව්‍යාපාර කමිටු ලේකම්-ධර්මසේන මහතා | 2019 වර්ෂ ආරම්භයේ පවත්වන්නට යෙදුන ව්‍යාපාර කලමනාකරණ කමිටු රැස්වීම සාර්ථක කර ගැනීම සඳහා පැමිණි සියලුම රාජ්‍ය නිලධාරින් ඇතුළු ගො.සං නිලධාරින්ට ස්තූතිය ප්‍රකාශ කරමින් රැස්වීම් කටයුතු අවසන් කරන ලදී. |



එම්. ඒ. බී. බණ්ඩාර
නේවාසික ව්‍යාපෘති කළමණාකරු
වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍යාංශය
නේවාසික ව්‍යාපෘති කළමණාකරණ කාර්යාලය
මොරගාය, මීනිපේ

## ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම - මිණිපේ ව්‍යාපාරය

### රාජ්‍ය නිලධාරින්ගේ පැමිණීමේ අත්සන් ලේඛනය - 2019/ 01/ 24

| අංක | නම | ආයතනය | තනතුර |
|---|---|---|---|
| 1. | M.A.D. බණ්ඩාර මයා | වාරි.කල. අංශය | නේ. ව්‍යා. කළමනාකරු |
| 2. | K.K.D.A.B. සුමනසේකර මයා | වාරි. දෙ | වාරි.ඉංජි |
| 3. | M.J.M කලීල් මයා | අමුණ ඉස්සීමේ ව්‍යාපෘතිය | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ |
| 4. | ඩබ්.එස්.සී ඒකනායක | වාරි. දෙ | කොට්ඨාස සහකාර |
| 5. | ජේ.ජී.සෙනවිරත්න බණ්ඩා | ගොවි.සං.දෙ-මොරයාය | ගොවි. සං. ප්‍රා. නිළධාරී වෙනුවට කෘ.ප.නි.ස |
| 6. | පී.ජී.එන්.කේ.ගුණරත්න | ගො.සං.දෙ-උල්පතගම | ගොවි. සං. ප්‍රා. නිළධාරී |
| 07. | යූ.බී.යූ.කීර්ති රත්න | ගොවි.සං. -හදුන්ගමුව | ගොවි. සං. ප්‍රා. නිළධාරී වෙනුවට කෘ.ප.නි.ස |
| 08 | කේ.ටී.ආර්.ප්‍රේමදාස | වාරි .කල.අංශය | ආයතන සං. නිලධාරි |
| | එම්.එම්.ඒ.ජී.තිලකරත්න බංඩා | එම | සං.සහකාර |
| | ඩී.එම්.රුවන් ප්‍රසාද් | එම | සං.නිලධාරි |
| | ඩී.පී.ජේ.එන්.කුමාරි | එම | එම |
| | එච්.එම්.සී.කේ.හේරත් | එම | එම |
| 13. | ඊ.ඒ.එන්.ඩී එදිරිසිංහ | වාරි.දෙ | ඉංජි.සහකාර -1 පියවර |
| | එල්.ජී.බී.පී.එන් බණ්ඩාර | වාරි.දෙ | ඉංජි.සහකාර -1 පියවර |
| 14. | එම්.ජී.රුපසිංහ | එම | ඉංජි.සහකාර -2 පියවර |
| 15. | ඒ.එම්.ආර්.ඩී.අතපත්තු වෙනුවට(ක්ෂේත්‍ර සහකාර) | එම | ඉංජි.සහකාර -3 පියවර |
| 16. | බී.කේ.ඒ.නිරෝෂන් | එම | ඉංජි.සහකාර -4 පියවර |
| 17. | පී.ඩී.එස්.එන්.ගුණතිලක | කෘෂි.දෙ | මූ. කෘෂි.උපදේශක,මොරයාය |
| | ඩබ්.එම්.පී.ජී.එන්.යූ.වාසල | කෘෂි.දෙ | මූ. කෘෂි.උපදේශක,මොරයාය |
| 18. | එම්.කේ.ටී.මහේන්ද්‍රන් | එම | මූ. කෘෂි. උපදේශක, උල්පතගම |

# ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම - මිණිපේ ව්‍යාපාරය

## ගොවි සංවිධාන නිලධාරින්ගේ පැමිණීමේ අත්සන් ලේඛනය - 2019/ 01/ 24

## 1 පියවර

| අඅ | නම | ගො.සං | තනතුර |
|---|---|---|---|
| 1. | වයි.එම්.ඩබ්.ජී.බිසෝමැණිකේ මිය | ඩී 01 | සභාපති |
| 2. | කේ.ජී. ධර්මදාස මයා, | ඩී 24 | සභාපති |
| 3. | එච්.එම්.ඥානවිමල මයා, | ඩී 25 | සභාපති |
| 4. | එස්.එම්. අබේරත්න මයා, | ඩී 39 | සභාපති |
| 5. | ආර් .එම්. ජයවර්ධන මයා, | ඩී 41 | සභාපති |
| 6. | ඒ.එම්. ධර්මසේන මයා, | ඩී 43 | සභාපති |
| 7. | ඒ.එම්.ඩබ්. සෙනවිරත්න මයා, | ඩී 45 | සභාපති |
| 8. | එම්.ජී. ජයවර්ධන මයා, | ඩී 49 | සභාපති |

### 2 පියවර

| අඅ | නම | ගො.සං | තනතුර |
|---|---|---|---|
| 9 | සී. රාජකරුණා මයා, | ඩී 7 | සභාපති |
| 1. | ජේ.එම්.කේ.ජී. විජේරත්න මයා, | ඩී 11 | සභාපති |
| 2. | ආර්.ජී ජයරත්න මයා | ඩී 12 | සභාපති |
| 3. | ඩබ්.ජී. වාලි මයා | ඩී 17 | සභාපති |
| 4. | ඩබ්.ජී.මිත්‍රසේන මයා, | ඩී 21 | සභාපති |
| 5. | ඒ.පී.වී.ජී.එස්. ගමගේ මයා, | ඩී 24 | සභාපති |
| 6. | කේ.එම්.ජී. අබේරත්න මයා, | ඩී 25 | සභාපති |
| 7. | මල්ලිකා කුමාරි මිය, | ඩී 29 | සභාපති |
| 8. | බි.එම්.දසරත්න බංඩා මයා, | ඩී 30 | සභාපති |
| 9. | එච්.එම්. යසරත්න මයා, | ඩී 32 | සභාපති |

## 3පියවර

| අඅ | නම | ගො. සං | තනතුර |
|---|---|---|---|
| 40 | ඩබ්.ජී. නිමල් ප්‍රේමතිල මයා, | ඩී 42 | සභාපති |
| 44 | ඒ.ජි. නිමල් සමරසිංහ මයා, | ඩී 51 | සභාපති |
| 45 | ආර්.කේ. චන්ද්‍රරත්න මයා, | ඩී 52 | සභාපති |
| 46 | ඩී.ජී. ලොකුබණ්ඩා මයා, | ඩී 56 | සභාපති |
| 47 | කේ.පී.ජී. උපාලි ජයතිස්ස මයා, | ඩී 57 | සභාපති |
| 48 | එස්.ඊ. චන්ද්‍රලතා මිය, | දේවගිරිය | සභාපති |
| 49 | පි.ජී. ජයසිංහ මයා, | බෝගහවැව | සභාපති |
| 51 | එම්.එම්.එස්.බංඩාර මයා, | මාරකවැව | සභාපති |
| 52 | කේ.ජී.ප්‍රේමදාස මයා | රඳුන්නවැව | සභාපති |
| 53 | ආර් එම් ආනන්ද රත්නායක මයා, | ගුරුවෙගයාය | සභාපති |

**4පියවර**

| අඅ | නම | ගො. සං | තනතුර |
|---|---|---|---|
| **55** | එස්.ඩබ්.එන්.ඩබ්. ජයරත්න මයා, | ඩී 2 | සභාපති |
| **57** | ඩබ්.ජී. රංබණ්ඩා මයා, | ඩී 4 | සභාපති |
| **59** | ඒ.ජී.සමරකෝන් බණ්ඩා මයා | කරවුගහවැව 1 | සභාපති |
| **61** | එම්.ආර්.ජී.චන්ද්‍රසිරි, | ඩී 58 | සභාපති |